1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/06/ANN.TR/2025 | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2026.02. 18 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>ස්ථාන මාරු - කළමනාකරණ සේවා නිලධාරී සේවය</u>**

2025 වාර්ෂික ස්ථාන මාරු වල නව බඳවා ගැනීම් වලින් ගැලපීමට තීරණය වූ හා අභියාචනා මත නව බඳවා ගැනීම් වලින් ස්ථාන මාරු ලබා දීමට තීරණය වූ නිලධාරීන්ගේ නාම ලේඛනයට අනුව 2026.02.18 දිනැතිව නව පත්වීම් ලබා දුන් හා ගැලපීම් කරන ලද දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්ගේ නාම ලේඛනය මේ සමඟ අමුණා එවන බව කාරුණිකව දන්වමි.

02. මෙම ස්ථාන මාරු ගැලපීමේදී, 2025 වාර්ෂික ස්ථාන මාරු වලදී නව බඳවා ගැනීම් වලින් අනුප්‍රාප්තිකයන් ලබා දුන් නිලධාරීන්, එකම සේවා ස්ථානයේ දිගු කාලයක් සේවයේ නිරතව සිටි නිලධාරීන් සහ දැඩි පෞද්ගලික දුෂ්කරතාවයන්ට (අසනීප තත්ව, දරුවන්ගේ ගැටළු වැනි) මුහුණ පා සිටින නිලධාරීන් හට ප්‍රමුඛතාවක් ලබා දීමට කටයුතු කළ බව අවධාරණය කරමි.

03. තවද, මෙහි සඳහන් ඇතැම් ස්ථාන මාරු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 (IV) හි 2.6 වගන්තිය ප්‍රකාරව "නිවාඩු ලබන නිලධාරියාගේ තනතුර ආයතනය තුළ පුරප්පාඩුවක් ලෙස සලකා පූර්ණ කාලීනව වෙනත් නිලධාරියෙකු පත් කිරීමට/ ස්ථාන මාරු කිරීමට පත් කිරීම් බලධරයාට අවස්ථාව ඇත." යන්න සැලකිල්ලට ගනිමින් ගැලපුම් කර ඇති අතර එම නිවාඩු ලබා ඇති නිලධාරීන් නිවාඩු අවසන් කර නැවත සේවයට වාර්තා කිරීමේදී එම තනතුරට මෙයින් පත් කර ඇති නිලධාරියා සේවා අවශ්‍යතාවය අනුව හෝ පුරප්පාඩු පවතින වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු ලබා දීමේ කොන්දේසියට තීරණයට යටත් විය යුතුය.

04. නවක පත්වීම් ලාභීන් පදනම් කර ගනිමින් සිදු කරන ලද ස්ථාන මාරු එම නව පත්වීම් ලාභීන් සේවයට වාර්තා කළ වහාම ඉටු කළ යුතු අතර ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන් ගේ ස්ථාන මාරු වීම් <u>ප්‍රසූත නිවාඩු අවසන්ව පැමිණි දිනට සති **01** ක් තුළ</u> ක්‍රියාත්මක කළ යුතුය.

05. අනුප්‍රාප්තික නිලධාරියා නව බඳවා ගැනීමක් නොවන අවස්ථාවකදී එකී ස්ථාන මාරු වීම් ලබා ඇති කිසිදු නිලධාරියෙකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා නොගත යුතු අතර අනුප්‍රාප්තික නිලධාරීන් පැමිණෙන තෙක් ඔවුන් රඳවා නොගෙන නව සේවා ස්ථානයන්හි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය. එය ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන බව අවධාරණය කරන අතර, <u>නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් හා ඔවුන්ගේ</u>

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

**ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි බාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය ප්‍රකාරව විනයානුකූලව කටයුතු කිරීමට සිදු වන බවද දන්වමි.**

06. එලෙස ස්ථාන මාරු වී යන නිලධාරීන් ස්ථාන මාරු යාමට ප්‍රථම රජයට අයත් ලිපි ලේඛන හා බඩු බාහිරාදිය, ආයතන ප්‍රධානියා හෝ මාණ්ඩලික නිලධාරියකු විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට භාර දීමෙන් අනතුරුව, ආයතන ප්‍රධානියා වෙතින් විධිමත් පරිදි නිදහස් කිරීමේ ලිපියක් ද භාර ගැනීමෙන් පසු නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ යුතුය.

07. මෙම ස්ථාන මාරු ලබා දී ඇත්තේ සියලුම නිලධාරීන් 2025 - වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ලබා දී ඇති නව සේවා ස්ථාන වෙත සේවයට වාර්තා කර ඇති බවට උපකල්පනය කිරීමෙන් බවත්, මෙහි දැක්වෙන සියලුම නිලධාරීන් හට ස්ථාන මාරු ලබා දී ඇත්තේ එම නව සේවා ස්ථාන වල ඇති වන පුරප්පාඩු පදනම් කර ගෙන බවත්, අවධාරණය කරමි.

08. තවද, 2025 - වාර්ෂික ස්ථාන මාරු තීරණ අනුව සේවා අවශ්‍යතාවය මත හෝ දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය මත හෝ ස්ථාන මාරු ලබා දුන් නව සේවා ස්ථානයේ සේවයට වාර්තා නොකර තවදුරටත් වර්තමාන සේවා ස්ථානයේ ම රැඳී සිටින නිලධාරීන්, **2025 වාර්ෂික ස්ථාන මාරු අනුව ලබා දී ඇති සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව, අදාළ නිදහස් වීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමෙන් පසු, ස්ථාන මාරු ලබා දී ඇති සේවා ස්ථානය වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා වගකීමෙන් කටයුතු කළ යුතුය.**

09. ස්ථාන මාරු ලද නිලධාරීන් නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කර, ඒ බැව් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් මා වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතු ය. මෙම ස්ථාන මාරුවීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

10. එබැවින්, ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතන වල නිලධාරීන් වෙත ද මෙම ලිපියේ සඳහන් කරුණු / උපදෙස් නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත